කඩුවෙල මහා නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩ සමීක්ෂණයෙන් හෝ භෞතික සත්‍යාපනයකින් සනාථකර නොගත් වටිනාකම රු.6,949,837ක් වූ වසර 20 ක් පැරණි ස්ථාවර වත්කම් ශේෂයක් ගිණුම්වල ඇතුලත්කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ඇණවුම්කර නොතිබුණු වටිනාකම රු.2,247,000 ක් වූ ත්‍රීරෝද රථ 03ක්, රු.1,375,000 ක් වටිනා කන්ටේනර් පෙට්ටි 02 ක් සහ රු.6,141,000 ක් වටිනා විදුලි ජනන යන්ත්‍ර 03ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) 2017 නොවැම්බර් 01 දින තැන්පත් කරන ලද රු.50,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.307,876 ක පොළිය ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.307,876 කින් අඩුවෙන් පෙන්නුම් කෙරේ.

(ඈ) සේවකයන්ට ලබා දුන් ණය, ආපසු අයකර ගැනීමේදී වැඩිපුර අයකර ගනු ලැබූ රු.32,686 ක්, මුලික ණය ශේෂයට එරෙහිව කපා හැරීම හේතුවෙන්, ලැබිය යුතු සේවක ණය ශේෂය රු.32,686 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 හා 2016 වර්ෂවල රු.9,369,587ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 22 ක් අත්හැර දැමීම නිසා සමුච්චිත අරමුදල එම වටිනාකමෙන් අඩුවෙන් හා ණයහිමියන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දින වනවිට සභාව වෙත ලැබී තිබූ රු.4,750,000 ක් වටිනා ජංගම පුස්තකාල බස් රථය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය දායකත්වය මත අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර තිබුණු මුදලින් 2014, 2015 හා 2016 වර්ෂවලදී ගෙවා තිබුණු රු.26,110,000 ක් ණයහිමි ගිණුමෙන් ඉවත් නොකිරීම නිසා එම වටිනාකමින් ණයහිමියෝ වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.111,797 ක මුද්දර ගාස්තු පොදු තැන්පතු යටතේ සටහන්කර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

---------------------

සභාව විසින් බාහිර පාර්ශවයන්ට විරුද්ධව වටිනාකම රු.288,480 ක් වූ නඩු 45 ක් හා බාහිර පාර්ශවයන් විසින් සභාවට විරුද්ධව වටිනාකම රු.25,369,299ක් වූ නඩු 28 ක් පවරා තිබූ නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

----------------------

ඉදිරිපත්කල මූල්‍ය ප්‍රකාශන අනුව මහජන බැංකු ජංගම ගිණුමේ හර ශේෂය රු.24,387,101 ක් වුවද උපලේඛනයේ දැක්වෙන බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව මුදල් පොතේ ශේෂය රු.4,975,471 ක් විය. මේ අනුව නොසැසඳූ වෙනස රු.19,411,630 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

ලැබිය යුතු ගිණුම්

--------------------

(අ) හිඟ කඩකුලී නොගෙවීම මත මුද්‍රා තබා ඇති සභාව සතු කඩ කාමර 14 ක් නැවත තක්සේරුකර කුලියට දීමට කටයුතුකර නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී වටිනාකම රු.2,354,369 ක් විය. එම කුලිය අයකර ගැනීමට කටයුතු කිරීම හෝ දීර්ඝ කාලීනව පැවත එන හිඟ කුලිය පොත්වලින් කපා හැරීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ආ) බත්තරමුල්ල උපකාර්යාලයට අයත් ජයවඩනගම උත්සව ශාලාවේ හිඟ කුලිය රු.307,430 ක් අයකර ගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

--------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

වටිනාකම රු.26,847,072 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව සාක්ෂි නොමැතිවීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මහා නගර සභා ආඥා පනත 254 (අ) (2) වැනි වගන්තිය | 58,640,348 | සභාවට අයවිය යුතු සියළු බදු හා මුදල් අයකර ගෙන එය මහා නගර සභාවේ අරමුදලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආදායම් විෂයයන් 9 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ 371 (5) | 896,472 | දිගින් දිගටම පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුල පැවතුණි |
| (ii) මු.රෙ 571 | 1,242,151 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු හඳුනාගෙන/විමසීම්කර ආදායමට ගතයුතු වුවත්, වර්ෂ 03 ක සිට පැවත එන තැන්පතු ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතුකර නොතිබුණි. |
| (ඇ) චක්‍රලේඛ | | |
| (i) 1980 දෙසැම්බර් 31 දින පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 දරන පළාත් පාලන චක්‍රලේඛය | | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව හෝ පළාත් පාලන සේවයට අයත් තක්සේරුකරුවෙකු විසින් යටත් පිරිසෙන් පස් වසරකට වරක්වත් එකී තක්සේරුගත බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, කඩුවෙල පොදු වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල්වල තක්සේරුගත බදු කුළිය 2001 වර්ෂයේ සිට ප්‍රතිශෝධනයකර නොතිබුණි |
| (ii) පළාත් පාලන කොමසාරිස්ගේ 1995 මාර්තු 19 වන දින අංක LG-95-4 දරන චක්‍රලේඛය | 470,000,000 | සභාව විසින් ස්ථාවර තැන්පතු ආපසු ගැනීමේදී බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රවර්තන වර්ෂයේදී ස්ථාවර තැන්පතු 31 ක් මුදල් බවට පත්කරගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) 2012 ජූලි 11 දිනැති අංක WP/IPD/01/2012 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | සැලසුම් කමිටුවට සහභාගීවීම වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු වෙත චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.194,000ක් ගෙවා තිබුණි. |
| (iv) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | 5,542,851 | පළාත් පාලන ආයතන මගින් අයකරනු ලබන සේවා ගාස්තු නාගරික සංවර්ධනය වෙනුවෙන් බැංකු ගිණුමක තැන්පත් කළ යුතු වුවද සභාව විසින් අයකරනු ලැබූ සේවා ගාස්තු එවැනි ගිණුමක තැන්පත් නොකර සභා ආදායමට බැරකර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

**2**.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.799,722,412 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.513,259,716 ක් විය.

**2**.2 මූල්‍ය පාලනය
-----------------

ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණු මහජන බැංකුවේ අංක 196-1 -001-6-3869561 දරන ජංගම ගිණුමේ දීර්ඝ කාලයක සිට පැවත එන රු.824,084 ක ශේෂයන් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය
------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 132,453,000 | 147,813,564 | 107,299,737 | 27,047,891 | 132,053,000 | 143,701,501 | 91,394,666 | 53,344,443 |
| (ii) කුලී | 11,347,325 | 19,323,989 | 8,514,434 | 1,899,115 | 10,993,114 | 17,716,693 | 7,805,879 | 1,314,304 |
| (iii)බලපත්‍ර ගාස්තු | 12,700,000 | 13,749,903 | 9,608,221 | - | 12,655,000 | 17,918,621 | 13,071,172 | - |
| (iv)වෙනත් ආදායම් | 683,196,500 | 787,783,777 | 187,520,341 | 15,096,773 | - | - | - | - |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

----------------------------------------

වරිපනම්, කඩකුලී, විනෝද බදු, බලපත්‍ර ගාස්තු වැනි සභාවට ලැබිය යුතු සමස්ත හිඟ ආදායම් රැස්කර ගැනීමේ දුර්වලතාවයක් පැවතුනි.

2.3.3 වරිපනම් හා බදු

-------------------

(අ) වරිපනම්

-----------

2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ හිඟ වරිපනම් බදු වටිනාකම රු.46,101,907 ක් වූ අතර එම හිඟ වටිනාකමින් රු.1,687,272 ක් 2018 වර්ෂයේදී අයකර ගෙන තිබුණි.

(ආ) විනෝද බදු

--------------

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතට අනුව සභා බල ප්‍රදේශය තුල පවතින සිනමා ශාලා 03කට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ විනෝද බදු මුදල රු.3,736,409 ක් විය. ඉන් රු.3,564,460ක් වර්ෂය තුළ අය වී නොතිබුණි. වර්ෂය ආරම්භයේ තිබූ රු.7,516,093 ක් වූ හිඟය වර්ෂය අවසාන වනවිට රු.9,730,039ක් දක්වා වර්ධනය වී තිබුණි. විනෝද බදු ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, නොගෙවා පැහැර හරින හිඟය සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට හෝ අයකර ගැනීමට සභාව කටයුතුකර නොතිබුණි.

(ඇ) සංවර්ධනය නොකල ඉඩම් මත බදු

----------------------------------------

2017 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමට 2016 දෙසැම්බර් 23 දින ගැසට් කර තිබූ නමුත්, 2017 වර්ෂය තුළදී සභාව විසින් ඉහත කී බදු අයකර නොතිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

(අ) ව්‍යාපාර බදු

---------------

කඩුවෙල හා අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන 209 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.589,000 ක හිඟ ව්‍යාපාර බදු ආදායමක් විය.

(ආ) කර්මාන්ත බදු

-----------------

කඩුවෙල හා අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයට අයත් කර්මාන්ත 380 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,835,000 ක හිඟ කර්මාන්ත බදු ආදායමක් විය.

(ඇ) වෙළඳ බලපත්‍ර

-----------------

කඩුවෙල හා අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාල බලප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන 191කින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු රු.953,000ක වෙළඳ බලපත්‍ර ආදායමක් විය.

(ඇ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

------------------------------

2017 වර්ෂය තුලදී පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කාලය අවසන්ව තිබූ ආයතන 21ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය යාවත්කාලීනකර නොතිබූ අතර එමගින් සභාවට රු.84,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.5 කුලී

-----

කඩුවෙල මහා නගර සභාවට අයත් පොදු වෙළඳ පොළ කඩ කාමර කුලිය 2001 වර්ෂයේ තක්සේරුව අනුව අයකර තිබූ අතර, වෙළඳසැල් සියල්ලෙහිම වාර්ෂික කුලිය රු.6,999,795 ක් විය. මෙම කඩකාමර වෙනුවෙන් 1984 වසරෙන් පසුව මේ වනතෙක්ම ගිවිසුම්වලට එළඹ නොතිබූ අතර, මෙම කඩ කාමර නියමිත කාලවලදී තක්සේරු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව මිලියන දෙකකට වඩා වැඩි මුදලක් වර්ෂ 10ක් තිස්සේ සභාවට අහිමි වී තිබුණි.

**3**. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

**3**.1 කාර්යසාධනය

-----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වනවගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යන්

----------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දී වටිනාකම රු.92,041,659 ක් වූ කර්මාන්ත 130 ක් සඳහා ටෙන්ඩර් ප්‍රදානයකර තිබූ නමුත් ඒවා ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. මෙම කර්මාන්ත වලට 2016 හා 2017 වර්ෂ සඳහා අතුරුගිරිය උපකාර්යාලයේ කර්මාන්ත 40 ක් සඳහා රු.27,383,558 ක් බත්තරමුල්ල උපකාර්යාලයේ කර්මාන්ත 49 ක් සඳහා රු.28,608,799 ක් සහ කඩුවෙල උපකාර්යාලයේ කර්මාන්ත 41 ක් වෙනුවෙන් රු.36,049,302 ක් ඇතුලත්ව තිබුණි.

(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

2017 වර්ෂයේදී ආරම්භ කල යුතු ඇස්තමේන්තු පිරිවැය රු.24,057,654 ක් වූ කර්මාන්ත 14 ක් 2018 ජුනි වනවිටද ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

----------------------------------

නගර සභා බල ප්‍රදේශයේ ජනිතවන කසළ සභාවේ සේවකයන් සහ වාහන යොදාගෙන සභාව විසින් එකතු කරමින් තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.135,755,158 ක් වැයකර තිබූ අතර එලෙස එකතු කරන කසළ බැහැර කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත් ආයතන 02 කට සමාලෝචිත වර්ෂය තුලදී රු.44,635,812 ක් ගෙවා තිබුණි. ඒ අනුව කසළ බැහැර කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකල මුළු මුදල රු.180,392,970 ක් විය. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මහා නගර සභා ආඥා පනතේ 228 වගන්තිය ප්‍රකාර තෝරාගත් කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) මහා නගර සභා ආඥා පනතේ 229 (1) වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගත යුතු ඇප ලබාගෙන නොතිබුණි.

(iii) මහා නගර සභා ආඥා පනතේ 131 වගන්තිය ප්‍රකාරව පරිසරයට, ජනතාවට හා වනසතුන්ට පීඩාවක් නොවන පරිදි කසළ බැහැර කිරීමට සභාව විසින් විධිවිධාන සැලසිය යුතු වුවත් කසළ බැහැර කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් විධිමත් ලෙස කසළ බැහැර කරන්නේද හා කුමන ප්‍රදේශයකට බැහැර කරන්නේද යන්න සභාව විසින් සොයා බලා නොතිබුණි.

(iv) සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය සඳහා, ප්‍රමාණවත් වාහන හා සේවක සම්පත් සභාව සතුව තිබියදී මෙම කර්තව්‍ය සභාවට වඩා වාසිදායකව ඉටුකර ගැනීම සඳහා අනාගත සැලසුම් හෝ අධ්‍යනයක් සිදුකර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) පුස්තකාල පරිපාලනය

-------------------------

බත්තරමුල්ල, කඩුවෙල හා අතුරුගිරිය යන උපකාර්යාලවල පවත්වාගෙන යන සභාව සතු පුස්තකාල තුනෙහි වටිනාකම රු.59,564 ක්වූ අබලි පොත් 430 ක්, වටිනාකම රු.116,559 ක්වූ අස්ථානගත පොත් 625ක් හා වටිනාකම රු.227,587 ක්වූ ආපසු භාරනොදුන් පොත් 814 ක් නිරීක්ෂණය වූ අතර මෙම පොත්වල වටිනාකම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සහ සුදුසු පරිදි සකස්කර පරිශීලනයට ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ජීවවායු ඒකකය

--------------------

බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය විසින් ප්‍රදානයක් ලෙස සභාවට ලබා දී තිබුණු ජීවවායු ඒකකය වසර ගණනාවක සිට අක්‍රිය තත්වයේ පැවති අතර එය යථා තත්ත්වයට පත්කර කසළ කළමනාකරණය සඳහා යොදවා ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) පෙර පාසැල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන

----------------------------------------------

බත්තරමුල්ල උපකාර්යාල බලප්‍රදේශයට අයත් පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය වෙත පෙර පාසැල් ගුරුවරියක හා සහායිකාවක අනුයුක්තකර තිබූ නමුත් දිවා සුරැකුම් මධ්‍යස්ථානය තුල කුඩා දරුවන් දෙදෙනෙකු පමණක් සිටි අතර, පෙර පාසැලෙහි දරුවන් නොසිටියහ. මෙම මධ්‍යස්ථානය කරා දරුවන් ඇතුලත් නොවීමට හේතු ලෙස පෙර පාසැල් ගොඩනැගිල්ල ප්‍රමාණවත් ඉඩකඩකින් යුක්ත නොවීම සහ සනීපාරක්ෂක පහසුකම් නොවීම බලපා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම මධ්‍යස්ථානයට අනුයුක්තකර ඇති පෙර පාසැල් ගුරුවරිය සහ සහයිකාවගේ සේවය දරුවන් දෙදෙනෙකුට පමණක් සීමා වී පැවතුණි.

(ඈ) ගබඩා පාලනය
-------------------
වාහනවලින් ගලවා ඉවත් කරන ලද අමතර කොටස් ගබඩාව තුලම අක්‍රමවත් ලෙස රඳවා තබා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------
(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත
------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 20 | 10 | 10 |
| ද්විතියික | 113 | 102 | 11 |
| ප්‍රාථමික | 467 | 430 | 37 |
| එකතුව | 600 | 542 | 58 |

(i) පුරප්පාඩුව පැවති මාණ්ඩලික නිලධාරි තනතුරු 10 අතර, නියෝජ්‍ය නාගරික කොමසාරිස්, නාගරික ලේකම්, ඉංජිනේරු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ආයුර්වේද වෛද්‍ය නිලධාරි පශු වෛද්‍ය නිලධාරි, තාක්ෂණ නිලධාරි (විශේෂ ශ්‍රේණිය) හා ආදායම් පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) පුරප්පාඩු 01 බැගින් පුරප්පාඩු 08 ක් හා පරිපාලන නිලධාරි 02 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ii) සභාවේ ප්‍රධාන කාර්යාලයට හා උපකාර්යාලවලට අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව අනියම් කම්කරුවන් 84 ක් සමාලෝචිත වර්ෂයේදී බඳවාගෙන තිබූ අතර, එම සේවකයින්ට ලිඛිතව රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණි. ඔවුන්ගෙන් බහුතරයකට කාර්යාලයේ ලිපි ලේඛන කටයුතු සහ පරිගණක කටයුතු පවරා තිබුණි.

(ආ) සේවක ණය
---------------
2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ ශේෂවල එකතුව රු.54,214,598 ක් වූ අතර එහි ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් රු.51,428 ක් විශ්‍රාම ගිය නිලධාරීන් 62 දෙනෙකුගෙන් රු.383,783 ක් සේවය අත්හිට වූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.127,555 ක් සේවය අත්හැර ගිය නිලධාරීන් 28 දෙනෙකුගෙන් රු.389,810 ක් හා මියගිය නිලධාරියකුගෙන් රු.7,500 ක් වශයෙන් අයවිය යුතු ශේෂ තිබුණි. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට සභාව කටයුතුකර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
(අ) බත්තරමුල්ල බලප්‍රදේශයේ 2011 වර්ෂයේ සිදුකරන ලද වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර ගෙන නොතිබීම හේතුවෙන් සභාවට අහිමි වූ ආදායම රුපියල් මිලියන 80 ක් පමණ විය. එමෙන්ම 1988/22 දරන 1988 මැයි 17 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 කට වරක් වරිපනම් තක්සේරුවක් කලයුතු වුවද කඩුවෙල, අතුරුගිරිය හා බත්තරමුල්ල යන බලප්‍රදේශයන් තුනෙහිම 2000 හා 2008 යන වර්ෂවල තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකිරීමෙන් සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලයට අයත් රෝයල් ප්ලාසා සාප්පු සංකීර්ණයේ දෙවන මහලෙහි කඩ කාමර තුනක් දිගු කාලයක සිට වසා දමා තිබූ අතර එම කාමර වලින් රු.29,782 ක හිඟ කඩකුලී අයකර ගෙන නොතිබුණි. ඉන් කඩ කාමර දෙකක් වර්ෂ 06 ක සිට හා අනෙක් කඩ කාමරය වර්ෂ 03ක සිට වසා දමා තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
-------------------------------

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම
------------------------------------

සභාව විසින් පවත්වා ගෙන යනු ලබන ඉඩම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඉඩම් ලේඛනයේ සටහන්කර තිබූ ඉඩම් කට්ටි 49 ක් සඳහා වූ හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. සභාව සතු ඉඩම් සහ පොදු පහසුකම් සඳහා ලබාදුන් ඉඩම් සම්බන්ධ සභාවේ පාලනය ඉතා දුර්වල තත්ත්වයක පැවතුනි.

3.5.2 පවරා නොගත් වත්කම්
-----------------------------

සතිපොළ නැවත ප්‍රතිස්ථාපනය කිරීම
---------------------------------------------

(අ) කඩුවෙල මහා නගර සභාව විසින් කඩුවෙල පොළ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා හෙක්ටයාර් 0.98211ක ඉඩම අත්පත්කර ගැනීමට 2014 වර්ෂයේදී රුපියල් 80,025,000 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර ඒ සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් සියයට 6.5 ක පොලි අනුපාතයක් මත ලබා ගන්නා ලද රුපියල් මිලියන 40 ක් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින වනවිට ණය වාරික සහ පොලී ලෙස රු.14,023,246 ක් ගෙවා තිබුණි. නමුත් ඉඩමේ හිමිකරුවන් වෙත වන්දි මුදල් ගෙවා සතිපොළ පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2017 සැප්තැම්බර් 09 වනදින මෙම සතිපොළ ජනතා අයිතියට පවරා දී ඇතත්, එදින වන තෙක් ඒ සඳහා ස්ථිර විදුලි සම්බන්ධතාවයක් ලබා ගෙන නොතිබුණු අතර වෙළඳසැල් 46 ක් වෙළඳාම් කිරීම සඳහා භාර දී නොතිබුණි.

3.5.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්
-----------------------------------------

(අ) 2013 වර්ෂයේ කඩුවෙල බස් නැවතුම් පොළෙහි සවිකරන ලද රු.3,900,000 ක් වටිනා විදුලි සෝපානය වර්ෂ ගණනාවක සිටම අක්‍රීය තත්වයේ පවතින අතර එය අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ඉහත විදුලි සෝපානය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී මිලදී ගෙන සවිකරන ලද රු.968,688ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය ඉන් ඉවත්කර නගර සභා භූමිය තුල නිෂ්කාර්යව දිරාපත් වෙමින් රඳවා තබා තිබුණි.

(ඇ) පොලිතින් බේල් කිරීම සඳහා 2016 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද රු.494,500 ක් වටිනා බේලින් යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන සභා භූමිය තුළ රඳවා තබා තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ මාර්ග වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවල මිලදී ගෙන තිබූ වටිනාකම රු.178,750ක් වටිනා මාර්ග නාම පුවරු 45 ක් සභා භූමියේ ගබඩාව අසල අනාරක්ෂිතව දමා තිබුණි.

(ඉ) නගර සභා බල ප්‍රදේශයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා 2017 ඔක්තෝබර් 20 වන දින රු.66,612,046 ක වියදමක් දරා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ඒකක 06 ක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අතුරුගිරිය උපකාර්යාල පරිශ්‍රයේ තබා ඇති බව 2018 වර්ෂයේ මැයි මස කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.6 හඳුනාගත් පාඩු

-------------------

ප්‍රධාන කාර්යාලීය ගබඩා ඒකකයේ තිබූ වටිනාකම රු.139,380 ක්වූ කොඩිකණු 141 ක් අස්ථානගත වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ඇස්තමේන්තු කරන ලද පුනරාවර්තන වියදම් හා සත්‍ය වියදම් සැසඳීමේදී වැය විෂයයන් 104 ක් වෙනුවෙන් ප්‍රතිපාදනයකර තිබූ රු. 81,396,500 කින් සියයට 50කට වඩා අඩුවෙන් වැයකර තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර කොමසාරිස්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගනුදෙනු අත්හැරීම් හා වැරදි ගිණුම්ගතවීම් සිදුවීම. |
| (ආ) කොන්ත්‍රාත් පාලනය | කොන්ත්‍රාත් අත්හැර දැමීම් පැවතීම. |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| (ඇ) වත්කම් හා දේපළ | සභාව සතු ඉඩම් හා පොදු පහසුකම් ලෙස ලද ඉඩම් ලේඛණගත නොකිරීම හා ආරක්ෂාවට පියවර නොගැනීම. |